# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,584 — 1958 නොවැම්බර් 14 වැනි සිකුරාදා — 14.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස—ඉඩම්

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට හැලපෙන පරිද්දෙනි)**


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1673 |
| ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම් ... | 1680 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 1681 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : ජේ. 57/58 ඩී 345; ආර්/කිව 214.

**1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොළඹ නාගරික සීමාව තුළ ග්‍රැන්ඩ්පාස්හි පිහිටි සැන්ට් ජෝශප් වීථියේ වරිපනම් අංක 119 දරණ අ.0, රූ. 1, පා. 29ක් පමණ විශාල ඉඩමට මායිම් :—

උතුරට : වේල්ස් කුමාර මාවතේ වරිපනම් අංක 502 සහ සැන්ට් ජෝශප් වීථියේ අංක 123 දරණ ඉඩම ;
නැගෙනහිරට : සැන්ට් ජෝශප් වීථිය ;
දකුණට : සැන්ට් ජෝශප් වීථියේ වරිපනම් අංක 113/11, 12, 14, 15, 16 සහ 117 දරණ ඉඩම් ;
බස්නාහිරට : වේල්ස් කුමාර මාවත.

1958ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති,

1673—**ජේ. ඇන්. බී** 8606—945 **(11/58)**

අංකය: කාප්‍ර. ඒ. 338/ජේ. 56 ඇල්. පී. 304

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කල පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ සංශෝධිත ආඥාපනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

(1) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ (බී) කොට්ඨාශයේ ඉඳුරෙ අගාරේ පිහිටි අතුමල් අගාර යන ඉඩමෙන් හතරැස් අඩි 1,152ක පමණ විශාලකම් ඇති කොටසක්. ඊට මායිම :—

උතුරට සහ දකුණට : පී. ජොසපීන් ප්‍රනාන්දු අයිතිකම කියන එම ඉඩමේම කොටස්,
නැගෙනහිරට : දිය පාර,
බස්නාහිරට : කුඹුර.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ (බී) කොට්ඨාශයේ දූනගහ ගම්මුලාදෑනි කොට්ඨාශය තුල පිහිටි කැන්දකැලේ යන ඉඩමෙන් හතරැස් අඩි 3,360ක පමණ විශාලකම් ඇති කොටසක්, ඊට මායිම ;—

උතුරට සහ දකුණට : පී. ඇම්. ජේ. ප්‍රනාන්දු අයිතිකම කියන එම ඉඩමේම ඉතිරි කොටස්,
නැගෙනහිරට : ඇම්. බී. ප්‍රනාන්දු මයා අයිතිකම් කියන කැන්දකැලේ යන ඉඩම,
බස්නාහිරට : දිය පාර.

(3) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ (බී) කොට්ඨාශයේ දූනගහ ගම්මුලාදෑනි කොට්ඨාශ තුල පිහිටි කැන්දකැලේ යන ඉඩමෙන් හතරැස් අඩි 2,400ක පමණ විශාලකම් ඇති කොටසක්. ඊට මායිම :—

උතුරට සහ දකුණට : ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු අයිතිකම කියන එම ඉඩමේම ඉතිරි කොටස්,
නැගෙනහිරට : වාතම්මන වින්සන්ට් සේනානායක අයිතිකම කියන කැන්දකැලේ යන ඉඩම,
බස්නාහිරට : බටේපොල ඇම්. බී. ප්‍රනාන්දු අයිතිකම් කියන කැන්දකැලේ යන ඉඩම.

(4) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ (බී) කොට්ඨාශයේ දූනගහ ගම්මුලාදෑනි කොට්ඨාශයතුල පිහිටි කැන්දකැලේ යන ඉඩමෙන් හතරැස් අඩි 192ක පමණ විශාලකම් ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ බස්නාහිරට : වින්සන්ට් සේනානායක අයිතිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස්,
නැගෙනහිරට : ප්‍රසිද්ධ පාර,
දකුණට : ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු අයිතිකම් කියන කැන්දකැලේ කොටසක්.

(5) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ (බී) කොට්ඨාශයේ දූනගහ ගම්මුලාදෑනි කොට්ඨාශය තුල පිහිටි කැන්දකැලේ යන ඉඩමෙන් හතරැස් අඩි 3,656 ක පමණ විශාලකම් ඇති කොටසක්. ඊට මායිම :—

උතුරට : ඇම්. බී. ප්‍රනාන්දු මයා. අයිතිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස,
නැගෙනහිරට : රාගම ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු අයිතිකම් කියන කැන්දකැලේ කොටසක්,
දකුණට : රාගම ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු සහ දූනගහ පී. වී. පී. ප්‍රනාන්දු අයිතිකම කියන කැන්දකැලේ කොටස්,
බස්නාහිරට : පිටිපන පී. ඇම්. ප්‍රනාන්දු අයිතිකම කියන කැන්දකැලේ කොටසක්.

(6) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ (බී) කොට්ඨාශයේ දූනගහ ගම්මුලාදෑනි කොට්ඨාශය තුල පිහිටි කැන්දකැලේ යන ඉඩමෙන් හතරැස් අඩි 968ක පමණ විශාලකම් ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : බටේපොල ඇම්. බී. ප්‍රනාන්දු අයිතිකම් කියන කැන්දකැලේ කොටස්,
දකුණට : දූනගහ පී. වී. පී. ප්‍රනාන්දු අයිතිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස,
බස්නාහිරට : බටේපොල ඇම්. බී. ප්‍රනාන්දු අයිතිකම් කියන කැන්දකැලේ කොටසක්.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1958 ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ දීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි සහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ උලපනේ ගම්මුලාදෑනි වසමේ, උලපනේ ගමෙහි පිහිටි සාන්ත මරියගේ වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණවූ පහත මායිම් සඳහන් ඉඩම් කොටස:—

උතුරට සහ දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස් ;

නැගෙනහිරට : වත්තේ අඩි පාර ;

බස්නාහිරට : ගම්පොල-නාවලපිටිය ප්‍රසිද්ධ පාර,

අංක : ජේ. 57/58 ඊ. 656/ඇල්. ඩී./ඒ—28,

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති,

1958ක්වූ ඔක්තෝබර් මය 25 වැනි දින,
කොළඹ දීය,

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, වර්ෂ 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ, හරිස්පත්තු ආදයම් කොට්ඨාශයේ, අංකුඹුර ගම්මුලාදෑනි කොට්ඨාශයේ, උඩගම ගමෙහි පිහිටි ගොඩපැල, මුදියන්සෙලෑ ගොඩකුඹුර, ගලගාවකුඹුර සහ ගෙදරගාවකුඹුර නැමති ඉඩම්වලින් ප්‍රමාණයෙන් හතරැස් අඩි 3,520ක් පමණවූ පහත මායිම් සඳහන් බිම්තීරු හතර :—

(1) ගොඩපැල : දිගින් අඩි 172 සහ පලලින් අඩි 4ක් පමණවූ—

උතුරට : අන්කුඹුර උඩගම–පල්ලේගම ගම්සභා පාර,
නැගෙනහිරට : ඩබ්ලිව්. ඇම්. කිරිබන්ඩා සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ගෙදරගාවකුඹුර,
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : ඒ. අතාළුඩ සහ කේ. පී. බිලින්ද් අයිතිවාසිකම් කියන නැකැත්ගෙදරවත්ත.

(2) මුදියන්සෙලෑගොඩකුඹුර : දිගින් අඩි 223 සහ පලලින් අඩි 6ක් පමණවූ—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස,
නැගෙනහිරට : කේ. ඇම්. ඩිංගිරි බන්ඩා සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියන ගලගාවකුඹුර,
දකුණට : අන්කුඹුර උඩගම–පල්ලෙගම ගම්සභා පාර,
බස්නාහිරට : කේ. කුලතුංග අයිතිවාසිකම් කියන නැකැත්ගෙදරවත්ත.

(3) ගලගාවකුඹුර : දිගින් අඩි 145 සහ පලලින් අඩි 5 පමණ—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස,
නැගෙනහිරට : කේ. වීරකෝන් සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියන ගෙදරගාවකුඹුර '' කමත '',
දකුණට : අන්කුඹුර උඩගම–පල්ලෙගම ගම්සභා පාර,
බස්නාහිරට : එච්. ඇම්. ඩිංගිරිමැනිකා සහ අනිකුත් අය අයිතිවාසිකම් කියන මුදියන්සෙලෑගොඩකුඹුර.

(4) ගෙදරගාවකුඹුර : දිගින් අඩි 85 සහ පලලින් අඩි 5ක් පමණ—

උතුරට : අන්කුඹුර උඩගම–පල්ලෙගම ගම්සභා පාර,
නැගෙනහිරට : කේ. වීරකෝන් සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියන ගෙදරගාවකුඹුර '' කමත '',
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස;
බස්නාහිරට : ටී. බී. අතාළුඩ සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියන ගොඩපැලකුඹුර.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංක ඇල් ඩී. 5031 ජේ 57 ඇල්. ජී. 354.

1958 ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ දීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනක

### 5 වැනි වගන්කිය යටතේවූ ප්‍රකාශයයි

පහත විස්තර කරන ඉඩම මහජන කායර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර සහ පාතහේවාහැට ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ උතුරු ගන්දහේ කෝරලේ අම්පිටිය උඩගම පිහිටි ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 39ක් වූ මූලික සිතියම් අංක ඒ 2,536 හි කැබලි අංක 2 යනුවෙන් මැන විස්තර කරන ලද පට්ටියකැලේවත්ත නැමැති ඉඩම.

සඳහන් අංකය : ජේ.57 ඇස්. 345—ඇල්.ඩී. 5022.

1958 ඔක්තෝබර් මස 21 දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, වර්ෂ 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් පරිදි මායිම් වී ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයේ රම්බොඩ වසමේ මල්හැව ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 2ක් වූ රම්බොඩ වත්තෙන් කොටසක් :—

උතුරෙන් : රම්බොඩ ඩී. ජී. මුදියන්සේට අයත් ඉඩමද,
නැගෙනහිරින් : ඇලකින්ද,
දකුණෙන් : සංගිලිපාලම දක්වා ඇති ගම්සබා පාර ද,
බටහිරින් : රජ්ගම පාර.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : ජේ. 57/58 ඊ. 483.

1958 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දීය.

**1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි**
**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

(1) ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරළයේ, මොරගොඩ ගමේ පිහිටි, අම්බලන්දූව වත්ත නමැති ඉඩමෙන්, අක්කර ¼ක් පමණ ප්‍රමාණය වන පහත සඳහන් මායිම් තුළවූ කොටස:—

උතුරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්;

නැගෙනහිරට : ඩී. ඒ. අස්සලආරච්චි අයිතිවාසිකම් කියන කුඹුරු ඉඩම.

(2) ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරළයේ කුඩා උෟරගහ ගමේ පිහිටි, අඹගහදූව නමැති ඉඩමෙන් අක්කර ¼ක් පමණ ප්‍රමාණය වන පහත සඳහන් මායිම් තුළවූ කොටස:—

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්;

දකුණට : ඇන්. ඩී. රිචඩ් අයිතිවාසිකම් කියන අඹගහදූව් අද්දර කැරව හෙවත් පුවක්ගහදෙනිය නමැති ඉඩම.

සඳහන් කළයුතු අංකය : ජේ/57 ඇල්. 361/ඇල් ඒ/සී 103.

1958 ඔක්තෝබර් මස 3 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙ යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුවේ උතුරු තිස්ස ගම්මුළාදැනි කොට්ඨාශයට අයිති 622 අවසාන ගම් සිතියමේ, අ. 1, රූ. 0, ප. 07ක බිම් තරමින් යුත් ලොට් 112 දරණ බිම් කට්ටිය මායිම් :—

උතුරට : 28 කැල්ල නමැති ඉඩම;

නැගෙනහිරට : යායගොඩ–අලුත්ගොඩ ගම් සහා පාර;

දකුණට : ගම් සහා මාවත;

බටහිරට : මුතිඅම්ම ඇලේ රිසර්වේසම.

අංකය: ජේ. 57 ඇල්. ජී. 460/ඇල්. ඩී. 7590.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1958 ක්වූ ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දීය.

---

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරනු ලැබූ**
**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්; 1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

යාපනය දිසාවේ, වඩමරාඩ්චි ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශයේ, වැල්වෙට්තුරේ ගම්මුලාදැනිතැනගේ වසමේ, උඩුපිඩ්ඩි කට්ටලයේ, වැල්වෙට්තුරේ ග්‍රාමයේ පිහිටි ප්‍රමාණයෙන් ලාච්චම්ස් 17, කැලි 6¾ (අ. 1, රූ. 0, ප. 17) ක් පමණැති, තුරුම්පන් තාල්වූ නොහොත් තේනි නැමැති මුළු ඉඩම් කොටස.

මෙකී ඉඩමට—

උතුරින් : හින්දු සුසානභූමිය හා වැල්වෙට්තුරෙ–පේදුරුතුඩුව පාරද,

නැගෙනහිරින් : එස්. කේ. තිරුසිත්තම්පලම් මහතා හිමිකම් කියන ඉඩම්ද,

දකුණින් : සුළු නගර සභා මාවතද,

බටහිරින් : නෙඩියකාඩු පිල්ලයාර් දේවාලය හිමිකම් කියන ඉඩම්ද මායිම් වී ඇත.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

මේ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු අංකය : ජේ. 57 එල්. ජී. 498.

1958 ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ දීය.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරනලද**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරනලද, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙ යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ලස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

යාපනය දිසාවේ උතුරු වලිකාමම් ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශයේ දකුණු පලාලි ග්‍රාමයේ පිහිටි (මුළ සැලැස්මේ ඒ 1;525 දරණ සිතියමේ 56ජී වැනි ඉඩම් කැබැල්ල) විල්ලවල්ලි නැමැති ඉඩමෙන් පර්චස් 9ක් පමණැති කොටසක්. මෙකී ඉඩමට :—

උතුරින්, නැගෙනහිරින් හා බටහිරින් : මෙකී ඉඩමේම ඉතිරි කොටස්වලින්ද,
දකුණින් : දිස්ත්‍රික්ක මාර්ග කාරක සභා පාරද මායිම් වී ඇත.

මේ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු අංකය : ජේ. 57/58 ඊ. 463.

1958 ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : 3/62/4/57/75.

**1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධිත**
**1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයිද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයිද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය චාර්ල්ස් පර්සිවෙල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, දෙරටියාව පළාතේ, හැවන්පොල නමැති ගමෙහි පිහිටි සන්නාසිකැලේ නමැති ඉඩමෙන් අක්කර 1ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : මාකස් මහතා හිමිකම් කියන අමුහේන නොහොත් මාකස්වත්ත නමැති ඉඩම;
නැගෙනහිරට : ගල්මොරටුගොල්ල නමැති ඉඩම සහ එම ඉඩමේ ඉතිරි කොටස;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස (පාරට වෙන්කර ඇති කොටස);
බස්නාහිරට : පිලිකන්දේ සිට හඳුරුක්කන්දට යන ප්‍රසිද්ධ පාර.

අංකය : ජේ 57 ඇල් ජී 497.

1958 ක්වූ ඔක්තෝම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති.

---

**1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ සංශෝධිත ආඥපනතින් සංශෝධිතවූ**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

ඇල්. ජී. 243.

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ සංශෝධිත ආඥපනතින් සංශෝධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුළු දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදයම් පාළක නිලධාරි කොට්ඨාශයේ පස්සර සුළු නගර සභා සීමාව තුල පිහිටි අංක 39යේ නගර මැණීමේ සිතියමේ අංක 83නේ කැබැල්ලෙන් දක්වෙන තැන්නෙ හේනෙවත්ත නමැති ඉඩමෙන් වර්ග අඩි 600ක පමණ බිම් ප්‍රමාණයකට මායිම් පහත දක්වේ :—

උතුරට : අංක 39යේ නගර මැණීමේ සිතියමේ අංක 83නේ කැබැල්ලෙන් කොටසක්;
නැගෙනහිරට : අංක 39යේ නගර මැණීමේ සිතියමේ අංක 83නේ කැබැල්ලෙන් කොටසක්;
දකුණට : අංක 39යේ නගර මැණීමේ සිතියමට උධෘත අංක 3නේ 301කේ කැබැල්ල;
බස්නාහිරට : එම නගර මැණීමේ සිතියමේ අංක 82කේ කැබැල්ල ද වෙත්.

ජේ. 57/58 ඇල්. ජී. 280.

1958ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී . ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද**
**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරනලද, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙ යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ලස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොටසට අයත් ඉඹුල්ගල වසමේ කලන්නෙක ගමේ පිහිටා තිබෙන අඹගස්තැන්නහේන නමැති ඉඩමෙන් අක්කර 2ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට : ගලපල්ලේහේන නැමති ඉඩම,
නැගෙනහිරට : අම්බලමමුලහේන,
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්.

අංකය : ජේ 57/58 ඊ 645/එල්. එම්. 5748.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1958 ක්වූ ඔක්තෝම්බර් මස 30 වැනි දින,
කොළඹ දීය.

අංකය : ඇල්.ආර්. 1643/ජේ57ඇල්. 188(වීඊ).

**ශුද්ධියක්**

1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වෙනි වගන්තිය යටතේ අංක 11,549 සහ 1958 ඔක්තෝබර් 10 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් ඉඩම් හා ඉඩම් සංවර්ධන පිළිබඳ ගරු ඇමති තුමා විසින් 1957 සැප්තැම්බර් මස 9 වෙනි දිනෙන් යුතුව කරන ලද ප්‍රකාශය මෙසේ සංශොධනය විය යුතුයි:—

ගමේ නම : කුඩා නෙළුබැව. බිම් කට්ටි අංක 2 සහ 3 යනුවෙනි.

---

අංකය ආර්/කිච් 35.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ අංකය : ඒ. 3,936. පිහිටීම : කලුබෝවිල නැගෙනහිර.

| කැබැල්ල | ඉඩමේ නම | විස්තරය | අයිතිකරුගේ නම | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | බුලුගහවත්ත, ඇන්ඩර්සන් වරිපනම් අංක 110/2 කොටස | පාරේ අවුරුදු 40 කට වැඩි පොල් ඉඩම ... | ඩබ්ලිව්. ජේ. එච්. රුද්‍රිගුගේ උරුමක්කාරයන්, 11, රුද්‍රිගු පටුමාවත, දෙහිවල | 0 0 39·29 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් නිසා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් 19 වෙනි දින පෙරවරු 10 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 දෙසැම්බර් 12 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මාවෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ නොවැම්බර් මස 3 දින,
කොළඹ කච්චේරියේදීය.

යූ. ඒ. ගුණරත්න,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

---

ඇල් ඩී 4874.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

7 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශයේ උඩගම්පහ කෝරලේ මහවත්ත පහලගම්මැද්දේ පිහිටි මුල්පැලැන නො. ඒ. 2,552 ලොට් නො. 1 දරණ අක්කර 8, රූඩ 0, පාවස් 38 වන තේක්කලන්ද වත්ත.

අයිතිවාසිකම් කියන්නෝ : කොළඹ හැව්ලොක් ටවුමෙ, නො. 11 ස්කෙල්ටන් පාරේ පදිංචි වී. එච්. ජෝසප් මහත්මිය, එස්මි ජෝසප් මහත්මිය, ඊ. පී. ඇල්බ්‍රෙච් මහත්මිය, ඩබ්ලිව්. ඒ ග්රේ මහතා සහ මහනුවර ලිෂින් සහ ලි සමාගම හාරේ රොබට් ඇල්ඩන්ස් මහතා.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් මස 22 වන දින පෙරවරු 11.30 වේලාවට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 දෙසැම්බර් මස 15 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකරගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියළුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත්කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ නොවැම්බර් මස 6 දින,
මහනුවර කච්චේරියේදිය.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

ඇල් ඩී 7340.

**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1950ගේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ කුඩාවැල්ල ගමට අයිති 303 අවසාන ගම් සිතියමේ 2 අතිරේකයේ මේ තොරතුරු ඇති ඉඩම් :

| ලොට් | නම | විස්තර | බිම් තරම | වෙනත් තොරතුරු | අයිතිවාසිකම් කියන්නා |
|---|---|---|---|---|---|
| 22 | වැල්ලද්දරගොඩ කදුරු විත්ත | අවුරුදු 40 පොල් ගස් 2 ... | 0 0 5·3 ... | ලොට් 7න් කොටසක්... | ජේ. ඇල්. පී. නෝනාහාමි, කේ. එච්. කර්නෙල්හාමි, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 23 | නුගගහවත්ත ... | අවු. 25ක පොල් ගස් 7, අවු. 1 පොල් පැල 1 | 0 0 4·3 ... | එම ... | විලියම්සිංඤෝ මුතුමාල, සර්නේලිස් මුතු මාල, කුඩාවැල්ල, නාකුලුගමුව |
| 24 | එම ... | අවු. 40 පොල් ගස් 10යි, අවු. 6 පොල් ගස් 2යි | 0 0 6·1 ... | එම ... | ජෝන්සිංඤෝ මුතුමාල, නෝනාහාමි මුතු මාල, කුඩාවැල්ල, නාකුළුගමුව |

| ලොට් | නම | විස්තර | බිම් තරම | වෙනත් තොරතුරු | අයිතිවාසිකම් කියන්නා |
|---|---|---|---|---|---|
| 25 | නුගගහවත්ත | අවු. 25 පොල් ගස් 2යි | 0 0 4·4 | ලොට් 7න් කොටසක් | ඒ. එච්. මෙන්ඩිස්, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 26 | එම | වැව්ලි නැත | 0 0 4·6 | එම | ඇල්. වයි. හීන්සිංඤෝ සහ ඇල්. වයි. දියුණුහාමි, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 27 | එම | අවු. 40 පොල් ගස් 5යි, අවු. 15 පොල් ගස් 1 | 0 0 4·4 | ලොට් 7 සහ 14 බී. කේ. වලින් කොටස් | ආර්. පී. අප්පුසිංඤෝ, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 28 | එම | අවු. 40 පොල් ගස් 3 | 0 0 3·6 | ලොට් 14 බීඇල් වලින් කොටසක් | පී. ඇස්. පී. දවිත්සිංඤෝ, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 29 | එම | අවු. 35 පොල් ගස් 3, අවු. 20 පොල් ගස් 5යි | 0 0 3·8 | ලොට් බී.ඇම් වලින් කොටසක් | ඇම්. කොර්නේලිස්, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 30 | එම | අවු. 35 පොල් ගස් 12, අවු. 1 පොල් පැල 3 | 0 0 2·6 | එම | හින්නිඅප්පු මුතුමාල, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 31 | එම | අවු. 20 පොල් ගස් 6යි | 0 0 3·1 | එම | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ ඇල්. වයි. පීදෙරෙක් අප්පු |
| 32 | එම | අවු. 1 පොල් පැල 8 | 0 0 3·3 | ලොට් 14 ඩීකේ. වලින් කොටසක් | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ, මුතුමාලගේ උපාරිස්අප්පු |
| 33 | එම | අවු. 40 පොල් ගස් 3, අවු. 25 පොල් ගස් 5, අවු. 5 පොල් ගස් 2 | 0 0 2 | ලොට් 17න් කොටසක් | ඇස්. එච්. දවිත්සිංඤෝ, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 34 | එම | අවු. 1 පොල් පැලයක් | 0 0 1·5 | ලොට් 14 බීටී වලින් කොටසක් | ඩී. වී. මාටින්සිංඤෝ, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 35 | එම | වැව්ලි නැත | 0 0 4·2 | එම | ආර්. පී. හීන්සිංඤෝ, කුඩාවැල්ල, නාකුළුගමුව |
| 36 | නිකකැටිය | වැව්ලි නැත. ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් තිබේ | 0 0 2 | ලොට් 14 බීයූ වලින් කොටසක් | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ, ජයවීර ලියනපටබැඳිගේ ජෝන් සිංඤෝ |
| 37 | නිකකැටිය | වැව්ලි නැත. තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් තිබේ | 0 0 2 | එම | මුතුමාල ජේම්ස්අප්පු, නාකුළුගමුව, කුඩාවැල්ල |
| 38 | එම | අවු. 5 දෙල්ගසක් තිබේ | 0 0 3·6 | රජයට අයිති මුදු වෙරළින් කොටසක් | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ, කොකුහෙන්දිනගේ හීන්සිංඤෝ විසින් අවසර නැතිව අල්ලා ගෙන තිබේ |
| 39 | එම | වැව්ලි නැත | 0 0 2 | රජයට අයිති මුදු වෙරළින් කොටසක් | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ, ජයවීරලියනපටබැඳිගේ චාර්ලිස් සිංඤෝ විසින් අවසර නැතුව අල්ලාගෙන සිටී |
| 40 | එම | වැව්ලි නැත. තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් තිබේ | 0 0 4·5 | ලොට් 14බීඇක්ස් 14 බී වයි වලින් කොටසක් | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ, ඇල්. වයි. සැමිනෝනා සහ ඇල්. වයි. උපාසක අප්පු |
| 41 | එම | වැව්ලි නැත | 0 0 3·1 | ලොට් 14 බී ඉසැඩ් වලින් කොටසක් | ඇල්. වයි. ලයිසහාමි, නාකුළුගමුව, කුඩාවැල්ල |
| 42 | එම | අවු. 30ක පොල්ගසක්, අවු. 3ක පොල් ගසක් | 0 0 2·9 | ලොට් 14බී. ඉසැඩ් වලින් සහ ලොට් 16න් කොටසක් | කොකු හෙන්නදිගේ පැන්ටිස් සිංඤෝ නාකුළුගමුව, කුඩාවැල්ල |
| 43 | එම | වැව්ලි නැත | 0 0 1·6 | ලොට් 14බීඩබ්ලිව් වලින් කොටසක් | ජේ. ඇල්. චාර්ලිස් සිංඤෝ, කුඩාවැල්ල නාකුළුගමුව |
| 44 | එම | එම | 0 0 0·5 | රජයට අයිති මුදු වෙරළින් කොටසක් | නාකුළුගමුවේ, කුඩාවැල්ලේ, මුතුමාලගේ ජේම්ස්අප්පු විසින් අවසර නැතුව අල්ලාගෙන තිබේ |

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් 17 (දහහත්) වැනි දින උදේ 10 වේලාවට නාකුළුගමුවේ රජයේ පාසැලේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 දෙසැම්බර් 9 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීමගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වර්ෂ 1958ක්වූ නොවැම්බර් මස 5 දින,
හම්බන්තොට කච්චේරියේ දිය.

ටී. සිවඥනම්,
හම්බන්තොට පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි. එනම් රජයේ නිවාස තැනීමේ ව්‍යාපාරයටය, කුරුණෑගල.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

වර්ෂ 1958වූ ජූලි මස 4 වෙනි දින නො. 11,410 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ,1958 ක්වූමැයි මස 23 වෙනි දින නො. ජේ. 57/58 ඇස් 78 දරණ ඉඩම හා ඉඩම් සංවර්ධන ඇමති තුමාගේ ප්‍රකාශය පරිදි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ විල්ලි හත්පත්තුවේ කුරුණෑගල නගර සභා සීමාවේ අංක 1 දරණ ගංගොඩ කොට්ඨාශයට අයත් අංක ඒ 1,545 දරණ මූ. සැ. මැන වඩා හොඳින් විස්තර කර තිබෙන බිම් කැබෙල්ල.

| කැබලි නො. | ඉඩමේ නම | විස්තරය | ප්‍රමාණය අ. රූ. ප. | අයිතිකරුගේ නම |
|---|---|---|---|---|
| 1. | දියකොන්දව හේන, වරිපනම් අංක 72, විල්ගොඩ රවුම් පාර | අ. 30 පොල් ගසක්ද, අ. 6 පොල් පැලයක්ද, අ. 6–20 දක්වා වයසැති කොස් ගස් 4 ද, අ. 10 අඹ ගස් 2 ද, අ. 5 දෙඩම් ගස් 3 සහ දෙළුම් ගස් 2ද, උළු සෙවිලි කරණ ලද බැම්ම සහිත ගොඩනැගිලි 2ද, බැම්ම සහිත වැසිකිළියක් ද, සහ සිමෙන්ති යෙන් කරන ලද ළිඳක් ද, සහිත පොල් වත්ත | 3 1 23·9 ... | කුරුණෑගල නගර සභාව |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වූ දෙසැම්බර් මස 22වෙනි දින පූ,.හා. 9.30ට කුරුණෑගල කච්චේරියේදී මා සමමුඛ විය යුතුයි.

තවද 1958වූ දෙසැම්බර් මස 15 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්‍වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ නොවැම්බර් මස 7 දින,
කුරුණෑගල කච්චේරියේ දීය.

කේ. වී. ඇස්. කතිර්ගාමනාතන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

යොමු අංකය : ඇල් ඒ. 3614.

**1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර—

අංක ඒ 1,534 දරණ මුලික සැලැස්ම. ගම—බස්නාහිර කිරිමැටියාන

| කට්ටි අංක | ඉඩමේ නම | විස්තර | හිමිකම් පාන්නාගේ නම | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | දබරේරා වත්ත ... | අවුරුදු 40ක් පරණ පොල් වත්තක් ... ... | කඳානේ උස්වැටකෙයියාවේ '' වික්ටෝරියා විලා '' හි විනිෆ්‍රිඩා හෙන්රිටා රූද්‍රිගු මහත්මිය | 20 2 22 |
| 2. | එම ... | තාවකාලික ළිඳක් සහිත අවුරුදු 40ක් පරණ පොල් වත්තක් සහ කුඹුරක් | එම ... ... | 18 0 13 |
| 3. | එම ... | පොල් අතු සෙවිලි කළ බදමයෙන් බඳින ලද බිත්ති සහිත තාවකාලික ගෙයකින් යුත් අවුරුදු 40ක් පැරණි පොල් වත්තක් | එම ... ... | 26 1 04 |
| | | | එකතුව ... | 65 1 39 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959යේ ජනවාරි මස 3 වැනි දින පූ. හා. 11ට නාත්තන්ඩියේ ප්‍රා. ආ. නිලධාරිතැනගේ කාර්‍යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ දෙසැම්බර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්‍වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 නොවැම්බර් මස 8 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්ත තැන, පුත්තලම් දිස්ත්‍රික්කය.

---

# ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

**දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි**

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස ගාල්ලේ කච්චේරියේ ඉඩම් ශාඛාවේ දී 1958 දෙසැම්බර් 16 වෙනි දින පූ. හා. 10ට 1935හේ අංක 19 දරණ ඉඩම් සග්‍රිකකිරීමේ ආඥපනත යටතේ ඉඩම් කච්චේරියක් ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.

**දීමට යන ඉඩමේ විස්තර**

| පැලෑනේ අංකය හා ගම | කැබැලි අංක | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| ඇෆ්.වී.පී. 482 ගිගුම්මඩුව ... | 233, 235, 237 ... | කාරියවසම් මාදුවාන ගමගේ ස්ටීවන් හපුගොඩ ... ... | 26 1 36 |
| ඇෆ්.වී.පී. 489 තලන්ගල්ල ... | 189, 241, 201 ... | අයිවන් කුවින්ටස් විජේතුංග ගුනරත්න ... ... ... | 21 1 33 |
| ඇෆ්.වී.පී. 550 කරාගොඩ ... | 656 ... | ලොකුගමගේ ජේම්ස් ... ... ... ... | 2 0 07 |
| එම ... | 670 ... | අහංගම වල්වෙගේ ගෞතමදාස ... ... ... | 2 2 06 |
| එම ... | 664 ... | වගිසාවාරිගේ ආබ්‍රහම් අමරසිංහ ... ... ... | 4 3 32 |
| එම ... | 818 ... | ගොලුවමරක්කල අගොස් සිංඤෙ ද සිල්වා ... ... | 2 1 10 |

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්.ජේ. 1242/ඇල්.ඊ. 8820.

## ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ 21 (2) දරණ රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කළුතර දිස්ත්‍රික්කයේ මීදලන පිහිටි 124 දරණ අවසාන ගම් පිඹුරයේ අක්කර 1, රූඩ් 2, පර්චස් 03ක විශාලත්වය ඇති අංක 138 දරණ බිම් කට්ටිය, මොරපිටියේ ශ්‍රී සද්ධර්ම සේවක සමිතියේ භාරකාරයින් වන, මීදලන, මොරපිටියේ පදිංචි පී. තේමිස් සිල්වා, යූ. සියනෝරිස් සිල්වා, සහ පී. ඇක්මන් සිල්වා යන මහතුන් විසින් එහි බෞද්ධ විහාරයක් ගොඩ නැංවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. සිය ආගමික කටයුතු සඳහා, 200ක් පමණ වූ මෙහි බෞද්ධ පවුල්වලට දැනට මේම ගමෙහි සිට සැතපුම් 4–8ක් පමණ යෑමට සිදු වී තිබේ. එහෙත්, ඉහත කී සමිතිය මගින් ගොඩ නැගෙන මෙම විහාරයෙන් එම පවුල්වල ආගමික කටයුතු පිරිමැසෙනු ඇත. මේ සඳහා දීමට ඉඩම තිබේ. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද අනුකූලව, යථොක්ත ඉඩම සමිතියට බදු දීමට රජය අදහස් කර තිබේ :—

(අ) වාර්ෂික බදු මුදල : රු. 7.50 ;

(ආ) මෙම ඉඩම බදු ගැනීමෙන් පස් වසක් ඇතුලත, බදු ගැනුම් කරුවන් විසින්, කළුතර දිසාපති තුමා සෑහිමට පත්වන පරිදි, එහි දන ශාලාවක්, විහාරයක් සහ ලැගුම් ගෙයක් ඉදි කළ යුතුයි ;

(ඇ) බදුගැනුම් කරුවන් විසින් මෙම ඉඩම බෞද්ධ පන්සලක් සඳහා මිස අන් කිසිවක් සඳහා නො යෙදවිය යුතුයි ;

(ඈ) මෙම ඉඩමේ තිබී ලැබෙන යම් කිසි පුරා වස්තුවක් වෙතොත්, ඒවා වහාම පුරාවිද්‍යා අධිකාරි තුමන් වෙතට බදු ගැනුම් කරුවන් විසින් පැවරිය යුතුයි ;

(ඉ) බදු ගැනුම් කරුවන් විසින්, (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාද සමසක් ඇතුලත, එම ගොඩනැගිලි, මහා භාරකාර තුමන් විසින් අනුමත කරනු ලබන ඔප්පුවක් පිට, මහා සංඝ රත්නයට පූජා කළ යුතුයි. එසේ පවරා දුන් පසු, මෙම ඉඩම පාලක විහාරාධිපති තුමන්ට හෝ භාරකරුට හෝ 99 අවුරුද්දකට බදු දෙනු ලැබේ.

3. මෙහි සඳහන් දින සිට සති 6ක් ඇතුලත, මේ ඉඩම, ඉහත සඳහන් කාරණය සඳහා බදු දීමට විරුද්ධතාවන් කරුණු සහිතව ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් නොකෙරේ නම්, ඉහත සඳහන් ඉල්ලීම පරිදි බද්ද පවරනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 නොවැම්බර් මස 14 වෙනිද,
කොළඹ දීය.

## විශෙෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී